**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 03

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

# 第 1−2 課　私(わたし)はサチニです

**Aim** පුද්ගල නාම භාවිතයෙන් තමා ව හඳුන්වා දීමට හැකි වීම

**国名(こくめい) ＋ 人 ＝ 国籍(こくせき)**

එනම් යම්කිසි රටක නාමයට පසු 人(じん) යන පදය එකතු කළ විට එය එම අදාළ රටෙහි ජාතිකයා බවට පත් වේ

れい：




スリランカ ＋ 人(じん) ＝ スリランカ人(じん) ＝ ශ්‍රී ලාංකිකයා.

日本(にほん) ＋ 人(じん) ＝ 日本人(にほんじん) ＝ ජපන් ජාතිකයා



**国名(こくめい) ＋語(ご) ＝ 言語(げんご)**

එනම් යම්කිසි රටක නාමයට පසුව යන පදය එකතු කල විට එය එම අදාළ රටෙහි භාෂාව බවට පත් වේ.

れい ：

スリランカ ＋ 語(ご) ＝ スリランカ語(ご) සිංහල භාෂාව

日本(にほん) ＋ 語(ご) ＝ 日本語(にほんご) ජපන් භාෂාව

රටවල් වල නම් කිහිපයක් ඉගෙන ගනිමු...

## 国々(くにぐに)の 名前(なまえ)

- スリランカ（suriranka） ශ්‍රී ලංකාව



- 日本(にほん) (nihon) ජපානය




- インド (indo) ඉන්දියාව



- スペイン ( supein ) ස්පාඤ්ඤය



- フランス ( furansu ) ප්‍රංශය



- ドイツ (doitsu ) ජර්මනිය




- ロシア ( roshia )රුසියාව



- 中国（ちゅうごく） ( chuugoku) චීනය



- イタリア ( itaria )ඉතාලිය



- 韓国（かんこく） ( kankoku ) කොරියාව



- イギリス ( igirisu ) එංගලන්තය



- アメリカ ( amerika ) ඇමරිකාව



- カナダ ( kanada ) කැනඩාව



- メキシコ ( mexico ) මෙක්සිකෝව



- オーストラリア (ōsutoraria) ඔස්ට්‍රේලියාව



Practice: write the nationality and language of the countries mention above.

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week:

Prepared by: (Write your name & school)

Grade: 12

# Unit 2-1 ひらがな


## හිරගනා අකුරු ලියමු

Aim

***හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.***



අපි や、ゆ、よ ( ය, යු, යො ) දක්වා ලියන ආකාරය බලමු




Copyright © learn-japanese-adventure.com

ඉන් පසු අපි පිළිවෙලින් ら、り、る、れ、ろ( ර, රි, රු, රෙ, රො ) දක්වා ලියන ආකාරය බලමු



Copyright © learn-japanese-adventure.com

わ සිට ん දක්වා ලියන්නේ මේ ආකාරයටයි.




Copyright © learn-japanese-adventure.com

♣ මෙහිදී を අකුර හවිතා කරන්නේ නිපාත සඳහා පමණි.

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 11, 12, 13 සහ 14 හි ඇති අභ්‍යාස කරන්න.

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 03

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

# Unit 日本文化（にほんぶんか） – 日本の地理（にほん の ちり）

Aim

ජපානයේ භූ විෂමතා ලක්ෂණ පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම.




ජපානය දූපත් දේශයක් වන අතර විවිධ විශාලත්වයන්ගෙන් යුත් දූපත් 7000 කට පමණ හිමිකම් කියනු ලබයි.

Hokkaidou (北海道（ほっかいどう）),honshu(本州（ほんしゅう）),

shikoku( 四国（しこく） ),kyuushu( 九州（きゅうしゅう） )

මෙන්ම Okinawa(沖縄（おきなわ）) ද මෙහි ප්‍රධාන දූපත් ලෙස සැලකිය හැක.

මෙම දූපත් ඇතුළුව වර්ග කිලෝමීටර් 378,000 ක් පමණ වූ භූමි ප්‍රමාණයක් ජපානය සතු වේ. එය ජර්මනියට වඩා


තරමක් විශාල වන අතර නෝවේ වලට තරමක් කුඩා වේ. රටින්, 73% ක් කඳුකරයන් වන අතර 67% ක් වනාන්තර වේ.

ජපන් දූපත් සමූහය, ආසියා මහද්වීප තලයෙහි පිටත මායිමට වන්නට පෘථිවි පෘෂ්ඨයෙන් ඉහලට නෙරා ඇති උස් වූ කඳු වැටියක මුදුන් සේ සලකන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන දූපත් මැදින් දිවෙන ඉතා දිගු කඳු පන්තීන් දැක ගත හැකි වේ. එලෙස, ජපානයේ මුහුදට මුහුණ පා ඇති කලාපය හා පැසිෆික් සාගරයට මුහුණ පා ඇති කලාපය ලෙස කලාප දෙකකි. උසම ස්ථානය ලෙස fujisan(富士山（ふじさん）) හැඳින්වෙන අතර මුහුදු මට්ටමේ සිට එහි උපරිම උස මීටර් 3,776 කි. (පිදුරුතලාගල මීටර් 2524). එය yamanashi(山梨（やまなし）) හා shizuoka (静岡（しずおか）) ප්‍රාන්ත වල පිහිටා ඇත.



# ජපානයේ ප්‍රධාන දූපත්

## Hokkaidou (北海道)




දෙවන විශාලතම දිවයින ලෙස හොක්කයිදෝ වර්ග කිලෝමීටර් 83,453 ක් වූ භූමි භාගයක පැතිර පවතී. භූමි ප්‍රමාණය අනුව මෙහි ජනගහනය අඩු අගයක් පෙන්වන අතර එය 5,377,435කි (2016). ප්‍රධාන නගරය sapporo(札幌市) වන අතර එය hokkaidou දූපතෙ අගනගරයද වේ. හොන්ෂු දූපතට උතුරට වන්නට පිහිටා තිබෙන අතර දූපත් දෙක අතර ඇති tsugaru (津軽) සමුද්‍ර සන්දියෙන් වෙන්ව පිහිටයි. කඳුකර හා යමහල් සහිත සානු මෙන්ම වෙරළබඩ තැනිතලා වලින් වටවී පවතී. ක්‍රියාකාරී මට්ටමේ ඇති යමහල් බොහොමයක් ඇති අතර උස වැඩිම ගිනිකන්ද ලෙස asabidake (旭岳) හැදින්වේ. එහි උස මීටර් 2,290 කි. ජපානයේ උතුරුකරයට වන්නට පිහිටි නිසාම, ශීත දේශගුණයට

ප්‍රසිද්ධියක් උසුලයි. ග්‍රීෂ්ම කාලයට වුවද මෙහි ශීත දේශගුණය පවතින අතර ශීත ඍතුව වනවිට හිම හා අයිස් පතනය වේ.

ほんしゅう
# Honshu 本州




ජපානයේ ප්‍රධාන නගර බොහොමයක් හොන්ෂු දූපත සතුව පිහිටා ඇත. ටෝකියෝ, ඕසකා, ක්යෝතෝ ප්‍රදේශයන් මෙම දූපතේ හරය ලෙස සලකන අතර එහි ජනගහනයෙන් 25% ක් ටෝකියෝ නගරය අවට වාසය කරයි. වර්ග කිලෝමීටර් 227,962 ක වපසරියක් පුරා හොන්ෂු දූපත පැතිරී පවතින අතර එය ලෝකයේ හත් වන විශාලතම දිවයිනයි. දිග ආසන්නව කිලෝමීටර් 1300 පමණ වේ. විවිධාකාර වූ භූ ලක්ෂණයන්ගෙන් සමන්විත මෙහි බොහෝ කඳු පන්ති දැකිය හැකි අතර ඇතැම් ඒවා යමහල් හෙවත් ගිනිකඳු වේ. උසම කන්ද ලෙස සැලකෙන fujisan(富士山 (ふじさん)) ද යමහලකි. එහි උස මීටර් 3,776කි. ජපානයේ අනෙක් ප්‍රදේශවල මෙන්ම භූ කම්පන තත්ත්වයන් මෙම දිවයිනේ ද දැක ගත හැක. හොන්ෂු, කලාප 5 කට හා ප්‍රාන්ත/දිස්ත්‍රික්ක 34 කට වෙන් කර ඇත. එම කලාපයන්, තොහොකු(東北), කන්තො(関東), චුබු(中部), කන්සායි(関西) සහ චුගොකු(中国) වේ.

# Kyuushu 九州(きゅうしゅう)




ජපානයේ තෙවැනියට විශාලතම දිවයින ලෙස ක්‍යුෂු හැදින්වේ. එහි භූමිය වර්ග කිලෝමීටර් 13,761 කි. ජනගහනය 12,970,479 කි. ක්‍යුෂු හි අර්ධ ශුෂ්ක දේශගුණයක් දක්නට ලැබෙන අතර එහි විවිධත්වයකින් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන දැක ගත හැකි වේ. වී, තේ, දුම්කොළ, බතල හා සෝයා ඒ අතරින් ප්‍රධාන වේ. ක්‍යුෂු හි විශාලතම නගරය fukuoka(福岡(ふくおか)) වන අතර ප්‍රාන්ත/දිස්ත්‍රික්ක හතකට වෙන් කර ඇත. පරිපාලනයේ පහසුව සඳහා okinawa(沖縄(おきなわ)) දූපතද එහි කොටසක් ලෙස සලකනු ලබයි. පැහැදිලිවම ක්‍යුෂු හි භූ ලක්ෂණ යමහල් හා සබැඳේ. ජපානයේ ක්‍රියාකාරී ම ගිනිකන්ද වන asosan (阿蘇山(あそさん)) පිහිටා තිබෙන්නේ ද ක්‍යුෂු දිවයිනෙහි වන අතර උණු දිය උල්පත් රාශියක් ද දක්නට ලැබේ. උසම කන්ද ලෙස මීටර් 1,788 උසැති kujuusan (九重山(くじゅうさん)) හැඳින්වෙන අතර එයද සුපුරුදු පරිදි යමහලකි.

# Shikoku 四国（しこく）




ජපානයේ ප්‍රධාන දූපත් අතරින් කුඩාම දූපත ලෙස ෂිකොකු හැඳින්වේ. වර්ග කිලෝමීටර් 18,800 ක් වූ වපසරියක් පුරා පැතිරී ඇත. ප්‍රධාන දූපත අවට ඇති කුඩා කොදෙව් රාශියකින් වටවී ඇත. පිහිටීම, ක්යුෂු දූපතට නැගෙනහිරින් හා හොන්ෂු දූපතට දකුණින් ද පිහිටා තිබේ. 3,845,534 ක් වූ ජනගහනයක් මෙහි වාසය කරයි. ෂිකොකු හි විශාලතම නගරය ලෙස matsuyama(松山（まつやま）)හැඳින්වෙන අතර පරිපාලන ප්‍රාන්ත/දිස්ත්‍රික් 4 කට වෙන් කර ඇත. මෙහි දී ද විවිධ භූ ලක්ෂණ දැකිය හැකි අතර කඳුකරයන් සහිත දිවයිනෙහි දකුණු පස මෙන්ම කුඩා තැනිතලා මිටියාවත් kouchi(高知（こうち）) ආසන්න පැසිෆික් වෙරළබඩ ප්‍රදේශයේ දක්නට ලැබේ. උසම ස්ථානය ලෙස ishidzuchisan (石鎚山（いしづちさん）) නම් වන අතර එය තරමක් 'හන්තාන කටුසු කොන්ද' මෙන් හැඩයක් ගනී. එහි උස මීටර් 1,982 කි. ක්යුෂු හි මෙන්ම, ෂිකොකු දූපතෙහි ද අර්ධ ශුෂ්ක දේශගුණයක් පවතී. උතුරුකරයේ පලතුරු වගා කෙරෙන අතරතුර අතීතයේ සිට පැවත එන සරුසාර වෙරළබඩ තැනිතලා බිම් දැකිය හැක.

ජපානය සාරවත් තැනිතලාවන් හා කඳුකර නිම්නයන්ගෙන් පොහොසත් රටකි. ප්‍රමාණයෙන් ඉතා විශාල වූ ජනාකීර්ණ තැනිතලා හෝ කඳුකර නිම්න දැක ගැනීමට නොමැත. විශාලතම තැනිතලා භූමිය ලෙස ටෝකියෝ හි පිහිටා ඇති kanto

かんとうへいや

තැනිතලාව(関東平野) හඳුන්වයි. එයද වර්ග කිලෝමීටර් 13,000ක් පමණ විහිදී පවතී.

なごや

අනෙකුත් වැදගත් තැනිතලා බිම් ලෙස, Nagoya (名古屋) නගරය වටා විහිදී ඇති nobi

のうびへいや - おおさか きょうと

තැනිතලාව(濃尾平野), osaka(大阪.) සහ kyouto(京都) නගර ප්‍රදේශ අතර ඇති


きない とうほく せんだい

kinai(畿内) තැනිතලා බිම, touhoku(東北) ප්‍රාන්තයේ sendai(仙台) නගරය වටා ඇති

いしかり

සෙන්දායි තැන්න සහ ishikari(石狩) තැනිතලාව hokkaidou හි පිහිටා ඇත. මෙම තැනිතලා බිම් බොහෝමයක් වෙරළබඩ තැනිතලා බිම් වන අතර එම ප්‍රදේශ අතීතයේ සිටම ඉඩ සංස්කරණය කිරීමෙන් පුළුල් වී ඇත.

ජපානයේ ගංගා බොහොමයක් බෑවුම් සහිත හා වේගයෙන් ගලා බසින අතර පහත් භූමියට ලඟා වන කිහිපයක් ජල තරණය කිරීමට යෝග්‍ය වේ. මෙම ගංගා වලින් බහුතරය



කිලෝමීටර් 300 ට අඩු දුරකින් සාගරයට එක් වන නමුත් කඳු මතින් ගලා බසින විට ඒවායේ ඇති වේගවත් බව නිසාම වටිනා, නැවත භාවිතයට ගත හැකි ජල විදුලිය වැනි සම්පත් ලබා දේ. ජල විදුලි බල විභවය මුළුමනින් ම පාහේ ලබා ගැනීමට ජපන් වැසියන් සමත් වී ඇත. ගංවතුර පාලන ක්‍රියාමාර්ගයන්ගේ පුළුල් සංවර්ධනයකට යොමු වීමට ඍතුමය වෙනස්වීම් හේතු පාදක වී ඇත. වැඩිම දුරක් ගලා බසින

しなのがわ ながの

ගංගාව ලෙස shinano නදිය(信濃川) නම් වන අතර එය nagano(長野) සිට

にいがた

niigata(新潟) ප්‍රාන්තයන් ඔස්සේ ජපන් මුහුදට එකතු වෙයි. එහි ද දුර කිලෝමීටර් 367 ක් පමණකි.(මහවැලි ගඟ කිලෝමීටර් 335කි ). විශාලතම විල ලෙස ක්‍යෝතො හි

び わ こ

උතුරට වන්නට biwako (琵琶湖) විල හැඳින්වෙන අතර එය වර්ග කිලෝමීටර් 681 ක් පුරා විහිදී පවතී.

# Regions and Prefectures of Japan

**Hokkaidō**

1. Hokkaidō

**Tōhoku**

2. Aomori
3. Iwate
4. Miyagi
5. Akita
6. Yamagata
7. Fukushima

**Kantō**

8. Ibaraki
9. Tochigi
10. Gunma
11. Saitama
12. Chiba
13. Tokyo
14. Kanagawa

**Chūbu**

15. Niigata
16. Toyama
17. Ishikawa
18. Fukui
19. Yamanashi
20. Nagano
21. Gifu
22. Shizuoka
23. Aichi

**Kansai**

24. Mie
25. Shiga
26. Kyoto
27. Osaka
28. Hyogo
29. Nara
30. Wakayama

**Chūgoku**


31. Tottori
32. Shimane
33. Okayama
34. Hiroshima
35. Yamaguchi

**Shikoku**

36. Tokushima
37. Kagawa
38. Ehime
39. Kochi

**Kyūshū & Okinawa**

40. Fukuoka
41. Saga
42. Nagasaki
43. Kumamoto
44. Ōita
45. Miyazaki
46. Kagoshima
47. Okinawa



# පරිපාලන පැතිකඩ.

ජපානයේ පරිපාලන කලාපයන් 9 ක් පවතී. එම කලාපයන් නවය තවත් කුඩා කොටස් වලට වෙන් කර පරිපාලනයේ පහසුව සඳහා ප්‍රාන්ත/දිස්ත්‍රික්ක 47 කට බෙදා වෙන් කර ඇත. විශාලතම කලාපය සහ පරිපාලන ප්‍රාන්තය/දිස්ත්‍රික්කය ලෙස hokkaidou( 北海道 ) සැලකෙන අතර වැඩිම ජනගහනයක් toukyou( 東京 ) ප්‍රාන්තයේ/දිස්ත්‍රික්කයේ වාසය කරයි. ජනගහනය මිලියන 126 ඉක්මවන අතර ජන ඝනත්වය වර්ග කිලෝමීටරයකට 333.9 කි.ජපානය සතුව වර්ග කිලෝමීටර් 978,000 ක්වූ මුහුදු වපසරියක් ඇත.

# ජපානයේ ගිනි කඳු



ජපානයේ වඩාත් ක්‍රියාශීලි වන්නේ හූෂු දිවයිනෙහි ටෝකියෝ සිට කි.මී. 140 ක් පමණ ඈතින් පිහිටි asama ගිනි කන්දකි. එහි උස අඩි 2568 ක් වේ. එහි ඉතිහාසය තුළ එය 130 වතාවක් පමණ පුපුරා ගොස් ඇති අතර, අවසන් වූ ලාවා නිදහස් කිරීම 2015 දී සිදුවිය.මෙම ගිනි කන්ද විශේෂයෙන් ආකර්ෂණීය වේ.

වර්තමානයේ ජපානයේ විශාලතම ක්‍රියාකාරී ගිනි කන්ද වන්නේ ආසෝ නම් ගිනි කන්දයි. . එය කුමාෂුටෝ ප්‍රාන්තයේ කියුෂු දිවයිනෙහි නිරිත දෙසින් පිහිටා ඇත. මෙම ගිනි කඳු මුදුන මීටර් 1592 ක් වන අතර කිලෝමීටර 24x18 කි.





ජපානයේ වඩාත් භයානක ගිනිකන්දක් වන්නේ සෑම වසරකම නිතිපතා කඩා වැටෙන sarakujima . ගිනි කන්දේ නිතරම දුමාරයක් පවතින අතර අවසන් පිපිරීම 2016 දී සිදු වී ඇත. sarakujima හි උස 1117 මීටර්, එහි වර්ග ප්‍රමාණය වර්ග මීටර් 77 කි. කි. කගොෂිමා ප්‍රාන්තයේ ජපානයේ ජනප්‍රිය ස්ථානයක් වන මෙය යෝධ ගිනි කන්දකි.



සංචාරකයන්ගේ විශේෂ අවධානය යොමු වන්නේ ජපානයේ වඩාත් ජනප්‍රිය හා විශාලතම කඳු මුදුන වෙතයි . මෙය රටෙහි සංකේතයක් වන ෆුජි නම් පූජනීය ස්ථානයකි. එය ටෝකියෝ සිට කිලෝමීටර 90 ක හොන්ෂු දිවයිනේ පිහිටා ඇත. Fujiyama යනු ජපානයේ විශාලතම සෘජු ගිනි කන්දයි. එය උස මීටර් 3,776 කි.